මගේ අංකය 029/03/17
නේවාසික ව්‍යාපාර කාර්යාලය
රාජාංගනය
201/01/17

ව්‍යාපාර කමිටුවේ සියළුම මහත්ම මහත්මීන් වෙත

<u>2019 ජනවාරි මස 17 වන දින ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව</u>

රාජාංගනය නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2019 ජනවාරි මස 17_වන දින පෙ.ව.9.30 ට ව්‍යාපාර කළමණාකරන කමිටු රැස්වීම රාජාංගනය නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලීය රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි. පැමිණ සිටි සියළු දෙනා නේවාසික ව්‍යාපෘති කළමණාකාරතුමන්ගේ පිළිගැනීම සහ ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

<u>සහභාගි වූ නිළධාරීන්</u>

01. එස්.ඩී.එම්.රාජපක්ෂ නේවාසික ව්‍යාපෘති කළමණාකරු
රාජාංගනය
02. ඩබ්ලිව්.ජේ. එම්.ලසිත් හේමාල් වාරිමාර්ග ඉංජිනේරු - වා.දෙ.
03. ඩබ්ලිව් ඒ.ආර්.කුලරත්න කාෂි රක්ෂණ මණ්ඩලය- සහකාර අධ්‍යක්ෂ
04. යු.කේ.ඒ.සී උක්වත්ත කොට්ඨාශ සහකාර
05. ඒ.පී. අතුකෝරළ මූලස්ථාන කෘෂිකර්ම උපදේශක
06. එස්.පි.කේ. මැද්දේගොඩ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තාක්ෂණ
සහායක
07. ඩබ්ලිව්.බී.එන්.එන්.වැලිහිද ඉංජිනේරු සහකාර - වා.දෙ
08. ජේ.ඒ.එස්.ඩබ්ලිව්. ජයකොඩි ඉංජිනේරු සහකාර -වා.දෙ
09.එස්.එල්.ඒ.රාසිම් ඉංජිනේරු සහකාර -වා.දෙ
10.එස්.ගුරුපරන ඉංජිනේරු සහකාර -වා.දෙ
11.ඩී.පී.එම්.එල්. පතිරණ ඉංජිනේරු සහකාර -වා.දෙ
12.කේ.කේ.ඩී.කඩිගමුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තාක්ෂණ
සහායක
13.ආර්.ඒ.එම්.කේ.අතපත්තු කෘෂිකර්ම උපදේශක
14.ආර්.එම්.ඒ.ටී.□□□□□□□□□□□ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තාක්ෂණ
සහායක
15 කේ.ඒ.ඩී.ඩී.එස්.කන්නන්ගර දෙපාර්තමේන්තුව තාක්ෂණ සහායක
16.ඩබ්ලිව්.එම්.පියසේන ඉඩම් නිළධාරි
**17.**එම්.ජී.කුඩාබංඩා ඉඩම් නිළධාරි
18.ඩී.එච්.එම්.උදයකුමාර ඉඩම් නිළධාරි
19.එම්.ජයරත්න පශු වෛද්‍ය නිළධාරි
20.ජේ.එම්.එස්.එස්. දිල්රුක්ෂි ඉංජිනේරු සහකාර -වා.දෙ
21.කේ.ඩී. කලංසූරිය ඉංජිනේරු සහකාර-වා.දෙ
22.එම්.පී.එස්.එස්. පතිරණ ඉංජිනේරු සහකාර- වා.දෙ.
23.එල්.ඒ.පී.ජයවික්‍රම ඉංජිනේරු සහකාර -වා.දෙ.
24.එල්.එස්.ඩී. ද සිල්වා තාක්ෂණ සහායක -වා.දෙ.
25.ඊ.පී.ආර්. දිසානායක තාක්ෂණ සහායක - වා.දෙ.
26.ඩී.ඩබ්ලිව්.පී.දහනායක තාක්ෂණ සහායක- වා.දෙ
27.සී.බී.මුදන්නායක ඉංජිනේරු සහකාර - වා.දෙ
28.පී.එම්.සුරසේන ජලපාලක
29.ඩබ්ලිව්.ඩී.එස්.ශාන්ත කුමාර ජලපාලක
30.ඩබ්ලිව්.ක්‍රිශාන්ත සංජීව ජලපාලක
31.ජේ.ඒ.අයි.පී.ජයසිංහහ ජලපාලක
32.එස්.එම්.එස්.එස්.ජයතිලක ජලපාලක
33.එච්.එම්.ඩී.එන්. හේරත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තාක්ෂණ සහායක
34.බී.එම්. ජගත්සිරි බංඩාර මූලස්ථාන කෘෂිකර්ම උපදේශක
35.. එල්.ඩබ්ලිව්. එස් මල්කාන්ති සංවර්ධන නිළධාරි -වා.මා.දෙ
36. එම්.ඒ.එන්.බංඩාර සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්

37. ආර්.පී.අයි.එස්.සිරිවර්ධන සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්
38. කේ.පී.කේ.එස්.පතිරණ සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්
39. ඩබ්ලිව්. එම්.ටී.බී. විජේකෝන් සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්
40. එ.පී.පි.කේ.පි. කරුණාතිලක සංවර්ධන නිළධාරි -නේ.ව්‍යා.කළ.කාර්
41.ජේ.එම්.එන්.එස් ජයසූරිය සංවර්ධන නිළධාරි - නේ.ව්‍යා.කළ.කාර්
42.ඩබ්ලිව්.පී.එස්.විජේසූරිය. රියදුරු නේ.ව්‍යා.කළ.කාර්.

<u>සහභාගි වූ ගොවි නියෝජිතයන්</u>

01.ඩී.එල්.සෝමපාල ගරු සභාපති එක්සත් ගැමුණු
02.එම්.එස්.වීරසිංහ ගරු ලේකම් ශ්‍රීවිජය
03.ඒ .ධර්මදාස ගරුසභාපති ප්‍රදීපාලෝක
04.නිහාල් වන්නිආරච්චි ගරු සභාපති රුහුණු
05.වී.ජී.සරත්සේන ගරු සභාපති රංකෙත(ද.ඉ)
06.ආර්.ඩී.සේනාරත්න ගරු සභපති සඳගල
07.එස්.එන්.එම්.ජයසේන ගරු සභපති රංකෙත(ව.ඉ)
08.ඩී.ඩී.එස්.රාජපක්ෂ ගරු සභපති කඳුරුවැව
09.ආර්.ඩී.ජවර්ධන ගරු සභාපති කණුපුරණ
10.එච්.එම්.සරත් කුමාර ගරු සභාපති ශ්‍රී උදාර
11.බී.ආනන්ද ගරු සභපති කන්ද උඩ
12.ආර්.එම්.සී නවරත්න ගරු සභපති සමඟි
13. ඩබ්ලිව්.එම්.එන්. ජයකොඩි ගරු ලේකම් සමඟි
14.ආර්.ඩී.ජයසිහ ගරු සභාපති පුබුදු
15.එල්.බී.ඉන්ද්‍රදාස ගරු සභපති පැරකුම් (ව.ඉ)
16.එල්.කේ.ධර්ම තිලකරත්න ගරු සභාපති ඩී.එස්.සේනානායක
17.ඩී.පී.සමරසිංහ ගරු සභාපති පැරකුම්(ද.ඉ)
18ආර්.එම්.එම්.බංඩාර ගරු සභාපති ජයශ්‍රී
19.බී.ඒ.ජයවර්ධන ගරු සභාපති නවෝදයා
20.ඩබ්ලිව්.ජී.වසන්තලාල් ප්‍රේමසිරි ගරු සභාපති අරුණළු උස්සාන
21.ඩබ්ලිව්.ඒ. දයානන්ද ගරු සභාපති බී.ඕ.පී. 721
22.එච්.ඩී.ධර්මරත්න ගරු භාණ්ඩාගාරික රංකෙත
23.ඩී.එම්.බී.එස්.සේපාල ගරු සභාපති සුභද
24.ඒච්.කේ.රණතුංග ගරු ලේකම් විජය
25.ටී.ජී.සෙනෙවිරත්න ගරු සභාපති පුරසඳ
26.පී.බී.දිසානායක ගරු සභාපති බී.ඕ.පී.397
27.ඩබ්ලිව්.පී.ඩී.ප්‍රියදර්ශනි ගරු භාණ්ඩාගාරික ශ්‍රී සාලියරාජ
28.එම්.ඒ මංජුල පුෂ්ප කුමාර ගරු සභාපති ශ්‍රී සාලියරාජ
29.යු.ජී.ජයවීර ගරු සභාපති නවජය
30.අයි.වී.සරණපාල උප සභාපති තිස්සපුර
31.එච්.එම්.එස්.සෝමතිලක ගරු සභාපති වීරපුර
32.එච්.එම්.පුංචිබංඩා ගරු සභාපති සාරකෙත
33. හැරිසන් හෙට්ටිආරච්චි ගරු සභාපති ජයමඟ
34.ඩී.අයි.සෙනෙවිරත්න ගරු ලේකම් ජයමඟ
35.එල්.එම්.සරත් විජේවර්ධන ගරු භාණ්ඩාගාරික ජයමඟ
36.ඩබ්ලිව්.ඒ.පී.බී.ගුණසේකර ගරු සභාපති බී.ඕ.පී.607
37.එච්.එම්.රුවන් උදයංග ගරු සභාපති කෙත්සිරි
38.වයි.වී.ඒ.දුමින්ද රේණුක ගරු ලේකම් අරුණළු
39.කේ.එම්.සරත් කුමාර ගරු සභාපති බී.ඕ.පී.662
40.ඩබ්ලිව්.ඒ.නුවන් ප්‍රේමරත්න ගරු ලේකම් සාලියගම
41.ටෙරස් ගාමිණී උප සභාපති සාලියගම
42.පී.ඒ.තිලකරත්න ගරු සභාපති උඩකම්මල

43.අයි.බී.පියතිස්ස ගරු සභාපති නවෝදය

ආයතන සංවර්ධන කටයුතු - එස්.එම්.එන්.සුභසිංහ මයා

| කාරණය | ප්‍රගතිය |
|---|---|
| ගො. සං.නිළවරණ මහ සභා පැවැත්වීම | 0 |
| මහ සභා පැවැත්වීම | 08 |
| මාසික කමිටු රැස්වීම් පැවැත්වීම | 51 |
| මුදල් සාරාංශ ලබා ගැනීම | 52 |
| අභ්‍යන්තර ගිණුම් පරීක්ෂාව | 52 |
| බාහිර ගිණුම් විගණනය | 0 |
| පුහුණු වැඩ සටහන් | 0 |
| | |

අදහස් දැක්වීම - නේවාසික ව්‍යාපාර කළමණාකරු - එස්.ඩී.එම්.රාජපක්ෂ මයා

මේ දිනවල ගොවි සංවිධාන අතර තරඟයක් පැවැත්වෙන බවත් ව්‍යාපාරයේ බෝහෝ වැඩ සිදුකර තිබුනද ගොවි සංවිධාන වල ඒවාට අදාල ලේඛන නොමැතිකම විශාල පාඩුවක් බවත් පැවසූ එතුමා දිස්ත්‍රික් මට්ටමට යාමට උත්සහකරන ලෙසත් පවසා සිටින ලදි.

එමෙන්ම ව්‍යාපාර කමිටුව පටන් ගැනිමට පෙර ගොවි සංවිධාන වල ගැටළු ලබාගෙන පසුව පිළවෙලින් සාකච්ඡා කිරිම සිදුකල යුතු බවත් සියළු දෙනා ස්වයං විනය පවත්වා ගැනිමට කටයුතු කරන ලෙසත් පවසා සිටින ලදි.

අදහස් දැක්වීම-සහකාර අධ්‍යක්ෂක,කෘෂි රක්ෂණ මංඩලය -ඩබ්ලිව්.ඒ.ආර්.කුලරත්න මයා

කිසියම් වගා හානියක් ඇත්නම් ඒ පිලිබඳව පලමුව කෘ.ප.නි.සහකාර මහතුන්ට දැනුම් දියයුතු බවත් එම ලේඛන වන්දි ගෙවිමේ කටයුතු සඳහා භාවිතා කරන බවත් පෙර වර්ෂවල අනවශ්‍ය ලෙස වන්දි ඉල්ලිම් කර ඇති බැවින්, මෙහිදි වගාහානි වාර්තා වූ පසු ක්ෂේත්‍රය පරික්ෂාකර බලා සත්‍යතාවය තිරණය කරන බවත් පවසා සිටින ලදි. එමෙන්ම රජයේ නොමිලේ රක්ෂණය ගංවතුර,වන අලි,නියං සදහා පමණක් බවත් වෙනත් ගැටළු සඳහා අතිරේකව මුදල් ගෙවා රක්ෂණය ලබාගතයුතු බවත් පවසා සිටින ලදි. ගැටළු ඇත්නම් විමසා සිටින ලෙසද දැන්වීය.

වාරිමාර්ග කටයුතු - වාරිමාර්ග ඉංජිනේරු - ඩබ්ලිව්.ජේ.එම්.ලසිත් හේමාල් මහතා

ජල ධාරිතාවය
රාජාංගනය ජලාශය අඩි - 34.5
අංගමුව ජලාශය අක්කර අඩි - 19.8

5/3 ජල මුර ක්‍රමය ක්‍රියාත්මක වන බව පැවසූ එතුමා ඉංජිනේරු සහකාර මහත්ම මහත්මීන්ට අයත් ක්ෂේත්‍රය ගොවි මහතුන්ට හදුන්වාදෙන ලදි.

ගොවි සංවිධාන අදහස්/යොජනා ඉදිරිපත් කිරීම්

.

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| දකුණු ඉවුර විජය ගොවි සංවිධානයේ | අතු ඇළ අංක 02 ස්පීල් එක කඩා වැටීමට ආසන්න බවත් එය | - | වා.මා.දෙ. |

| | | | |
|---|---|---|---|
| ගරු ලේකම් එච්.කේ .රණතුංග මහතා | ඉක්මනින් ප්‍රති සංස්කරණය කල යුතු බවත්. | | |
| දකුණ ඉවුර ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති නිහාල් වන්නිආරච්චි මහතා | යාය 07 ස්පිල් එකෙන් ජලය නිතර ගලා යන බවත් හේතුව ඇළ ගොඩවී ඇති නිසා යැයි පැවසු එතුමා ඇල පතුල සුද්ධ කිරීමට අවශ්‍ය හෙයින් රාජාංගනය ව්‍යාපාරයට ස්කැවේටර් යන්ත්‍රයක් ඉතා ඉක්මනින් ලබාගැනිමට අත්‍යවශ්‍ය බවත් පැවසීය. | | වා.මා.දෙ. |
| වම් ඉවුර ගොවි සංවිධානයේ ගරු සභාපති එල්.බී ඉන්ද්‍රපාල මහතා | බඹරේ හංදියේ ඇතිවී තිබු ගැටළුව විසදා දීම සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ස්තුතිය පුදකල එතුමා ගොවි සංවිධානයේ සමාජිකත්වය නොමැති ගොවි මහතුන් සිදුකරන යම් යම් වැරදි සදහා නිතීමය කටයුතු සිදුකිරිමේදි විශාල ලෙස ගැටළුඇතිවන බව. | | වා.මා.දෙ .නේ.ව්‍යා.කාර් |
| දකුණ ඉවුර ජයමඟ ගොවි සංවිධාන ගරු සභාපති හැරිසන් හෙට්ටි ආරච්චි.මහතා | අතුඇළ අංක 03 ස්පිල් එක අසල ප්‍රධාන පාර හරහා උමයකින් වතුර යන බවත් තම ගොවි සංවිධානයේ FC ඇළවල් වලට අයත් කෘෂි පාරවල් සඳහා පස්ලෝඩ් කිහිපයක් දමාදෙන ලෙසත් පැවසීම. | JCB යන්ත්‍රයක් හා ට්‍රැක්ටර් ලබාදිමට හැකි බව | වා.මා.දෙ. |

ලිපි ඉදිරිපත් කිරිම

**1).** දංගස්වැව උස්සාන ගොවි සංවිධානය

නවෝදය උස්සාන ගොවි සංවිධානයේ පොම්පගේ දක්වා ඇති පාර වෙන්කරවා ගැනිම සදහා ඉල්ලීම.

**2).** පී.ඥානරත්න මහතාගේ ලිපිය

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය අසල සිට වැවේ පංසල වෙත ඇති වැලි පාර කාපට් කර දීම සඳහා ව්‍යාපාර කමිටුවේ අනුමැතිය සහිත ලිපියක් ලබාදෙන ලෙස ඉල්ලීම් කිරිම

ගොවි සංවිධාන අදහස්/යොජනා ඉදිරිපත් කිරීම්

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| දකුණු ඉවුර බී.ඕ.පී. 716 උස්සාන ගොවි සංවිධානයේ ගරුසභාපති ටී.ජී.සෙනෙවිරත්න මහතා | උස්සාන ප්‍රෙද්ශයේ ඇති ඇල රක්ෂිතය,පාර හා උස්සාන පොම්පාගාරයට අයත් රක්ෂිත සීමා වෙන්කර දෙනලෙස ඉල්ලීම. | උස්සාන වල රක්ෂිත වෙන් කිරීම මේ වර්ෂයේ ප්‍රමුකතාවය ලබාදෙන බව | වා.මා.දෙ. නේ.ව්‍යා.කා. |
| වම් ඉවුර පුබුදු ගොවි සංවිධානයේ ගරු සභාපති ජයසිංහ මහතා | පිවිසුම් ඇළේ ගොවිමහතුන්ට ඇළෙන් ජලය ලබාගැනිමට නොහැකි බවත් වැටිදමා වතුර ගන්නා නිසා ටනවුට් කිහිපයක් සකස්කරදෙනමෙන් ඉල්ලීම | - | වා.මා.දෙ. |
| වම් ඉවුර කන්ද උඩ ගොවි සංවිධානයේ ගරු සභාපති. බී .ආනන්ද මහතා | ගොවි සංවිධානයේ බී.ඕ.පී . සැලසුම් නොමැතිකම නිසා ඉඩම් ආරවුල් ඇති වී ඇති බවත් ඉඩම් මැන මෙම සැලසුම් සකස්කර දෙන ලෙසත් ඉල්ලීම. | මේ පිළිබඳ පරීක්ෂාකර බලන බව. | වා.මා.දෙ. |
| දකුණ ඉවුර සාලියරාජ ගොවි සංවිධානයේ ගරු සභාපති එම්.ඒ මංජුල පුෂ්ප කුමාර මහතා | ගොවි සංවිධානයේ FC 05 ඇළේ එක් කුඹුරු කට්ටියකට අංකයක් නොමැති බවත් එම කුඹුරු හිමියා ගොවි සංවිධානයේ කිසිදු කාර්යකට සහය නොදෙන බවත් පැවසූ එතුමා ඇළවල් කීපයක අගාවත සෝදායාමට ලක්වන බැවින් බට කිපයක් ලබාදෙන ලෙස පැවසීය. | - | වා.මා.දෙ. |
| වම්.ඉවුර කණුපුරණ ගොවි සංවිධානයේ ගරු සභාපති ආර්.ඩී.ජවර්ධන මහතා | සේනා දැලඹුවාගේ ගැටළුව සඳහා වන්දියක් ලබාදිය හැකිනම් ඒ සඳහා කටයුතු කරදෙන ලෙසත්,දින 5 වසා දින 03ක් ජලය ලබාදිම තම ගොවි සංවිධානයට ගැටළුවක් බවත් ඇල වසා දැමීමේදි සම්පූර්නයෙන් නොවසා අර්ධ වශයෙන් වසා දමන ලෙසත් ඉල්ලා සිටීම | ඒ පිළිබඳව නිරික්ෂණය කොට බලා ක්‍රියාමාර්ග ගන්නා බව. | වා.මා.දෙ |

.

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| වම් ඉවුර උඩකම්මල උස්සාන ගොවි සංවිධානයේ ගරු සභාපති පී.ඒ තිලකරත්න මහතා | උස්සාන ඉඩම් වල සිතියම් නොමැති බවත් එම නිසා මායිම් ලකුණු කර දෙන ලෙසත් ඉල්ලීම | | වා.මා.දෙ. |
| දකුණ ඉවුර එක්සත් ගැමුණු එක්සත් ගොවි සංවිධානයේ ගරු සභාපති ඩී.එල්. සෝමපාල මහතා | ඇළ බන්ටෙකේ පොල්පැල සිටුවා ඇති බැවින් මේවා සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යම්කිසි ක්‍රියාමාර්ගයක් ගතහැකිදැයිවිමසීම. | ඇළවේලී ආරක්ෂා කිරීමේ වගකීම ගොවි සංවිධාන වලට පවරා ඇති බවත් රක්ෂිත කණු දමා රක්ෂිත වෙන්කර දමන ලෙසත් පැවසීය. | වා.මා.දෙ. නේ.ව්‍යා.කා. |
| වම් ඉවුර අරුනළු උස්සාන ගොවි සංවිධාන ගරු සභාපති ඩබ්ලිව්.ජී. වසන්තලාල් ප්‍රේමසිරි මහතා | අරුනළු උස්සානය පිහිටුවීම උදවු උපකාර කල සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට ස්තූතිය පුදකර සිටින ලදි. | - | - |
| දකුණ ඉවුර බී.ඕ.පී. 607 උස්සාන ගොවි සංවිධානයේ ගරු සභාපති ඩබ්ලිව්.ඒ.පී.බී.ගුණසේකර මහතා | යෝජිත නව ටැංකියේ වෙත පොම්ප නිවසේ සිට ඇති බට ලයින් එක ඉතා පැරණි බැවින් 250M පමණ වු එම බටලයින් එක නැවත ගොඩදැමීමට හා කපල් කිරිමට ව්‍යාපාර කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවත් පැවසීය. | එය නිරීක්ෂණය කර බලා තීරණයක් ගතයුතු බව | වා.මා.දෙ. |
| වම් ඉවුර වීරපුර ගොවි සංවිධානයේ ගරු සභාපති එච්.එම්.එස්. සෝමතිලක මහතා | දංගස්වැව කොටසේ ඇලවල් වල දොරටු ප්‍රතිසංස්කරණය කර දෙන ලෙසත් දංගස්වැව පසුකල විට හමුවන විට පලමු පුනිලයේ වැලිකොට්ට යෙදුවාට ඔරොත්තු නොදෙන බවත් මේ සදහා කොන්ක්‍රිට් බැම්මක් සකස්කර දෙනලෙස. | | වා.මා.දෙ. |
| | | | |

කෘෂිකර්ම කටයුතු ද/ ඉවුර මුලස්ථාන කෘෂිකර්ම උපදේශක - බී.එම්. ජගත්සිරි බංඩාර මයා

හෙක්ටයාර් 19-20 න් අතර ප්‍රමාණයක බිත්තර වී වැඩසටහන සිදුකර ඇති බවත්, පැරෂුට් හෙක්ටයාර් -150 වැඩි ප්‍රමාණයක් හා යාන්ත්‍රිකව පැලසිටුවීම හෙක්ටයාර් 08ට ආසන්නව සිදුකර ඇති බවත් පැවසූ එතුමා යල් කන්නය
ආරම්භ කිරීම අස්වනු නෙලනවාත් සමඟ ආරම්භ කලහොත් අතරමැදි කන්නය සාර්ථකව කලහැකි බවත් පැවසීය. එමෙන්ම ඒකාබද්ධ පලිබෝධක ක්‍රියාමාර්ග යටතේ මිරිස් ආදේශන 25 ක්පමණ සිදුකර ඇති බවත් වැඩිදුරටත් පවසා සිටින ලදි.
උදු සහ මුං ප්‍රභේද සඳහා අත්හදා බැලීම් කිහිපයක් සිදුකර ඇති බවත් GAP වැඩසටහන් යටතේ පේර,කෙසෙල්,දෙළුම් වැනි වගා සඳහා ගොවීන් යොමුකර ඇති බවත් මෙහිදි ගුනාත්මක ඵලවළු පලතුරු නිෂ්පාදනය අරමුණ බවත් පැවසීය. එමෙන්ම මෙම දිනවල උග්‍ර ගැටළුවක් පවතින සේනා දැලඹු හානිය පිළිබඳව දැනුවත් කිරීමක් සිදුකරන ලෙස ඒ.පී.අතුකෝරල මහත්මියට ආරාධනා කරන ලදි.

කෘෂිකර්ම කටයුතු ව/ ඉවුර මූලස්ථාන කෘෂිකර්ම උපදේශක - ඒ.පී.අතුකෝරල මිය

අධික වර්ෂාවත් සමඟ පොටෑසියම් වගා බිම් වලින් සේදියාම නිසා එම ඌනතාවයක් පවතින බවත් මේ සමඟ දුඹුරු පුල්ලි රෝගය වැනි රෝග ව්‍යාප්ත වන බවත් පැවසූ එතුමිය මේ සඳහා දින 30ත් 45ත් ගතවූ පසුව පොටෑසියම් පොහොර වගාවට යෙදිය යුතු බවත් පවසා සිටින ලදී.

එමෙන්ම මේ දිනවල පවතින පින්න හේතුවෙන් කොළපැල රෝගය පැතිර යන බැවින් ඒ සඳහා දිලීර නාශක ලබාදිය යුතු බවත් පැවසීය.වම් ඉවුරේද සේනා දැලඹු හානිය දැකිය හැකි බැවින් බඩඉරිඟු වගාව සිදුනොකරන ලෙසත් ගොවි මහතුන්ගේ දැඩි අවධානය මේ සඳහා යොමුවිය යුතු බවත් පැවසූ එතුමිය සේනා දැලඹු මර්ධනය කිරිම නිරින්ෂණය කිරිම සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක වන බවත් පැවසිය.එමෙන්ම වෙනත් බෝග සඳහා පලිබෝෂකයන් පැමිණ ඇත්දැයි නිරික්ෂණය කිරිම 23 වන දින සිදුවන බවද වැඩිදුරටත් එතුමිය පවසා සිටින ලදී.

ගොවිජනසේවා දෙපාර්තමේන්තුව - වම් ඉවුර ගොවිජන සංවර්ධන නිලධාරි

ගොවිජනසේවා සම්බන්ධයෙන් ඇති කරුණු කරණා පසුගිය වර්ෂයේ සපුරා ඇති බවත් මෙම වර්ෂයේද සියළු කටයුතු සාර්ථකව සිදුකිරිමට බලාපොරෝත්තු වන බවත් පැවසූ එතුමා ගොවිජන අබිමන් පිළිබඳ තරගාවලියක්

පවතින බවත් වම් ඉවුර ගොවිජනසේවා මධ්‍යස්ථානය හොද ස්ථානයක ඇති බවත් ඒ සඳහා ගොවිමහතුන්ගේ දායකත්වය ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

සත්ව සංවර්ධන කටයුතු-දකුණ ඉවුර, සත්ව සංවර්ධන උපදේශක- ජී.එම්.ජයරත්න මයා

2018 වර්ෂය සාර්ථක ඉලක්ක කරා යාමට හැකිවූ බවත් දකුණ ඉවුර සත්ව පාලන කටයුතු සිදුකරන අය ව්‍යාපෘති වලට සම්බන්ධවීමට කැමතිනම් ඉල්ලීම් කරන ලෙසටද දැනුවත් කර ඇති බවත් ගිය වර්ෂය අවසාන වනවිට ඉහල ප්‍රගතියක් ලබා ඇති බවත් පැවසූ එතුමා ගැටළු ඇත්නම් විමසා සිටින ලෙසත් පවසා සිටින ලදී.

ජනපද නිළධාරි ,දකුණ ඉවුර- මුලස්ථානඉඩම් නිලධාරි - ඩබ්ලිව්.එම්. පියසේන මයා

මේ වන විට ව්‍යාපාරයේ 80% ට පමණ බලපත්‍ර ලබාදී අති බවත් ඉඩම් කච්චේරි කැඳවීමේදි මිනිසුන්ගේ සහභාගිත්වය ඉතා අඩු බවත් පැවසූ එතුමා one milion one යටතේ රාජාංනය දකුණ ඉවුර බොහෝ ප්‍රෙද්ශ මැනිම් කටයුතු කර ඇති බවත් තව ඉතිරි වී ඇති කොට්ඨාශ වේනම් මෙම වැඩසටහන යටතේ සියළු ඉඩම් මැන දිමනා පත්‍ර ලබාදීමට කටයුතු කරන බවටද පවසා සිටින ලදී.

එමෙන්ම ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සම්බන්ධකරගෙන විශාල සේවාවක් සිදුකිරිමට හැකිවූ බවද පැවසූ එතුමා ජයභූමි වැනි ඉඩම් සඳහාද රේඛා චිත්‍ර යොදා නව ඔප්පුවක් සකස්කර දීමට හැකි බවත් පැවසීය.

දකුණ ඉවුර විජය ගොවි සංවිධානයේ ගරු ලේකම් -එච්.කේ. රණතුංග මහතා

හිමිකම් ඔප්පු ලබාදිම කලින් සිදුකරත් වර්ථමානයේ එම ක්‍රමය ක්‍රියාත්මක නොකරන්නේ මන්දැයි විමසා සිටින ලදී.
එහිදි අදහස් දැක්වූ මුලස්ථාන ඉඩම් නිලධාරිතුමා හිමිකම් ඔප්පු ලබානොදුන්නත් හිමිකම් ලියාපදිංච් කරන බව පැවසීය.

වම් ඉවුර සුහද ගොවි සංවිධානයේ ගරු සභාපති- ඩී.එම්.බී.එස්.සේපාල මහතා

රේඛා චිත්‍ර ඔප්පුට එකතු නොකිරීම පිළිබඳව ගැටළුවක් පවතින බවත් එයට හේතුව කුමක්දැයි විමසා සිටින ලදි.
එහිදි අදහස් දැක්වූ මුලස්ථාන ඉඩම් නිළධාරිතුමා රේඛා චිත්‍රය යොදා එම අංකයටම නව ඔප්පුවක් ලබාදෙන බව පැවසීය.

ස්තුති කථාව

ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති නිහාල් වන්නි ආරච්චි මහතා විසින් ව්‍යාපාර කමිටු රැස්වීමට සහභාගි වී සහයෝගය ලබාදුන් රාජ්‍ය නිළධාරින් ඇතුළු සියළු ගොවි සංවිධාන නිලධාරින්ට තුති පුද කරන ලදී.



එස්.ඩී.එම්. රාජක්ෂ
නේවාසික ව්‍යාපාර කළමණාකරු
නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලය
රාජාංගනය

පිටපත් -
01.අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය දැ.ගැ.පි.
02.දිස්ත්‍රික ලේකම් අනුරාධපුරය.කුරුණෑගල පුත්තලම දැ.ගැ.පි.
03.වාරිමාර්ග අධ්‍යක්ෂ අනුරාධපුරය දැ.ගැ.පි.
04. නියෝජ්‍ය කෘෂිකර්ම.අධ්‍යක්ෂ අන්තර් පළාත් දැ.ගැ.පි.
05. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් දැ.ගැ.පි.
06.ප්‍රාදේශිය ලේකම් රාජාංගනය .ගිරිබාව. පුත්තලම දැ.ගැ.පි.
07.අධ්‍යක්ෂ වත්කම් කළමනාකරණය වා/දෙ දැ.ගැ.පි.
08. වාරිමාර්ග ඉංජිනේරු රාජාංගනය දැ.ගැ.පි.
09. ගොවිජන සංවර්ධන නිලධාරි වම් ඉවුර. දකුණ ඉවුර සාලියවැව දැ.ගැ.පි.
10. මුලස්ථාන කෘෂිකර්ම උපදේශක වම් ඉවුර දකුණ ඉවුර දැ.ගැ.පි.
11. කෘෂි රක්ෂණ මණ්ඩලය තඹුත්තේගම /මහව දැ.ගැ.පි.
12. ගොනුවට